පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

කළමනාකරණය හා සංවර්ධනය පිලිබඳ ඩිප්ලෝමාව
පළමු සමාසිකාන්ත පරීක්ෂණය - 2019
**DM 012 – සංවර්ධන ගැටළු සහ අභියෝග**

උපදෙස් : වේලාව : පැය 3 යි
මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න හතක් (7) අඩංගු වේ.
ප්‍රශ්න හතරකට ( 4 ) පමණක් පිළිතුරු සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු හැටක් ( 60 ) ලැබේ.

---

1. i. ආර්ථික වර්ධනය හා ආර්ථික සංවර්ධනය අතර වෙනස පැහැදිලි කරන්න.
(ලකුණු 5 යි)

ii. “ආර්ථික සංවර්ධනය සඳහා ආර්ථික වර්ධනය අවශ්‍ය වන නමුත් ආර්ථික සංවර්ධනය සම්පූර්ණවීම සඳහා තවත් කොන්දේසි ඉටු විය යුතුය” අදහස් දක්වන්න.
(ලකුණු 4 යි)

iii. මූර්ත දළ දේශීය නිෂ්පාදිතය(Real Gross Domestic Product (GDP) යනු කුමක්ද? රටක ආර්ථික සංවර්ධනය මැනීමේදී මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වැදගත්කම කෙටියෙන් පහදන්න.
(ලකුණු 6 යි)

2. i. “ශ්‍රී ලංකාවේ මානව හිමිකම් දර්ශකය ජාතික වශයෙන් සැලකියයුතු තරම් ඉහළ අගයක් ගත්තද පළාත් මට්ටමෙන් හා අංශ අතර මානව සංවර්ධනයේ විෂමතා පවතී” . විස්තර කරන්න .
(ලකුණු 6 යි)

ii. ඵලදායිතා පරතරය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? රූප සටහනක් ඇසුරින් විස්තර කරන්න.
(ලකුණු 5 යි)

iii. රටක ඵලදායිතා මට්ටම තීරණය කරන ප්‍රධාන සාධක දක්වන්න.
(ලකුණු 4 යි)

3. i. රටක ආර්ථික කාර්යක්ෂමතාව තීරණය කරන හා ඉහළ නංවන සාධක විස්තර කරන්න. (ලකුණු 6 යි)

ii. නවෝත්පාදන යන්න නිර්වචනය කොට ආර්ථික සංවර්ධනය සඳහා වැදගත්වන ප්‍රධාන නවෝත්පාදන වර්ග විස්තර කරන්න. (ලකුණු 6 යි)

iii. තිරසාර සංවර්ධනය නිර්වචනය කරන්න. (ලකුණු 3 යි)

4. i. "දිගුකාලීන ලෝක සාමයක් ලඟාකර ගැනීම සඳහා පවතින ප්‍රධානම අභියෝගය දුප්පත්කමයි" අදහස් දක්වන්න. (ලකුණු 8 යි)

ii. "ශ්‍රී ලංකාවේ දුප්පත්කම ග්‍රාමීය ප්‍රපංචයකි" මෙම ප්‍රකාශණය සමඟ ඔබ එකඟද? විස්තර කරන්න. (ලකුණු 7 යි)

5. i. ශ්‍රී ලංකා ආර්ථිකයේ දක්නට ලැබෙන සේවා වියුක්තිය මූලික වශයෙන් ව්‍යුහාත්මක සේවා වියුක්ති තත්වයකි" මෙම ප්‍රකාශණය සමඟ ඔබ එකඟද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 8 යි)

ii. සේවා වියුක්තියේ ආර්ථික හා ආර්ථික නොවන පිරිවැය විතාර කරන්න. (ලකුණු 7 යි)

6. i. පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය සිදුවන්නේ කෙසේද? රූප සටහනක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 6 යි)

ii. "ශ්‍රී ලංකාවේ වර්තමානයේ දක්නට ලැබෙන උද්ධමනීය තත්වය හුදු ඉල්ලුමෙන් ඇදුනු හෝ පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයක් නොවේ. එය ආර්ථික ක්‍රමයේ පවතින ව්‍යුහාත්මක ගැටලු පදනම් කරගෙන පැනනැගුනු තත්වයකි" ශ්‍රී ලංකා ආර්ථිකයෙන් සුදුසු උදාහරණ ගෙන ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 9 යි)

7. "කොළඹ පාරිභෝගික මිළ දර්ශකයේ පදනම් වර්ෂ, එනම් CCPI 2006/07, 2002 සහ 1952 සලකා බැලීමේදී ශ්‍රී ලාංකිකයින්ගේ වියදම් ගතිපැවතුම් හා භාණ්ඩ පැසෙහි සංයුතිය පිළිබඳ කදිම චිත්‍රයක් ලබාදෙයි". ඉහත සඳහන් පදනම් වර්ෂ තුනහී ශක්තිමත්භාවයන් හා දුරවල්තාවන් දක්වමින් මෙම කියමන විභාග කරන්න. (ලකුණු 15 යි)